# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,015 - 2017 අප්‍රේල් මස 12 වැනි බදාදා - 2017.04.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 784 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 785 |


*සැ. යු.* - පිළිකා සරණ භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 අප්‍රේල් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය*** **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 මැයි මස 05 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අප්‍රේල් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් පාලන නිවේදන

## වත්තල මාබෝල නගර සභාව

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරිය)

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් වන පුද්ගලයින් විසින් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් සඳහන් කර ඇති ස්ථානයෙහි 2017.12.31 වැනි දින දක්වා ගව මස් අලෙවිසැලක් පවත්වාගෙන යෑම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට ඉල්ලුම් කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම්, තමා විරුද්ධත්වය දැක්වීමට හේතු විස්තර සහිතව පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මගින්, දැන්වීම් *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතු බවට ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරිය) අංක 7(2) වැනි වගන්තිය පරිදි මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. පී. එච්. සමරවික්‍රම,
නගර සභාවේ ලේකම් හා වත්තල මාබෝල නගර සභාවේ
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

2017 මාර්තු මස 28 වැනි දින,
වත්තල මාබෝල නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *ව්‍යාපාරය* | *ව්‍යාපාරය පවත්වන ස්ථානයේ ලිපිනය* |
|---|---|---|---|
| 01 | එම්. ටී. එම්. රියාස් | ගව මස් අලෙවිසැල | අංක 762, මීගමු පාර, මාබෝල, වත්තල |

04-360

---

## දඹුල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, යම් ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්ය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකළ ඉඩමක විශාලත්වය තක්සේරුව කිරීම සඳහා එකී යම් දේපළක අයිතිකරුට හා පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යැයි එකී පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මම මෙයින් තීරණය කරමි.

බී. එම්. එම්. බාලසූරිය,
ලේකම්,
දඹුල්ල ප්‍රාදේශීය සභාව,
සීගිරිය.

2017 ක් වූ මාර්තු මස 06 වැනි දින.

04-227

**නුවරඑළිය මහා නගර සභාව**

සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 286 (ආ) උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. කේ. ආර්. බී. රත්නායක,
නාගරික කොමසාරිස්,
නුවරඑළිය මහා නගර සභාව.

2017 මාර්තු මස 24 වැනි දින.

***තීරණය***

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 දින අංක 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට නුවරඑළිය මහා නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 286 (ආ) උපවගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමි.

04-371

---

# විවිධ දැන්වීම්

**මීගමුව මහ නගර සභාව**

වාහන ගාල් කිරීමේ ගාස්තු අය කිරීම

මහ නගර සභා ආඥාපනතේ 267 වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 272(32) වගන්තිය ප්‍රකාරව මීගමුව මහ නගර සභාව වෙත පැවරී ඇති අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලතල අනුව 1989.01.20 දිනැති අංක 541/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කර වැළඳගත් සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ XVIII වන කොටසේ වාහන නතර කර තැබීම අතුරු ව්‍යවස්ථාව යටතේ හා බලයලත් නිලධාරී, බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා වශයෙන් මහ නගර සභා ආඥාපනතේ 286(අ) වගන්තිය ප්‍රකාරව මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව පහත දක්වෙන තීරණ ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එස්. සී. සුගත් කුමාර,
නාගරික කොමසාරිස්.
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මහ නගර සභාව,
මීගමුව.

මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති පහත සඳහන් ස්ථානයන්හි රථ වාහන නතර කර තැබීම වෙනුවෙන් 2017 ජනවාරි මස 01 වැනි දින සිට මෙහි උපලේඛන I හා II හි සඳහන් ආකාරයට ගාස්තු අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. (රජයේ බදු ඇතුළුව)

### I උපලේඛනය

1. ප්‍රධාන බස් නැවතුම්පල ඉදිරිපිට කොටස හා මාර්ගය දෙපස
2. මීගමුව අධිකරණය ඉදිරිපිට.
3. ලෙයිටන් ලේන් ක්‍රීඩාංගණය (සෑම වර්ෂයකම දෙසැම්බර් උත්සව සමය සඳහා පමණි.).
4. තිල්ලන්දූව හන්දියේ සිට බී. පී. මොහොමඩ් හන්දිය දක්වා දිවෙන ග්‍රීන්ස් පාරේ ඔරලෝසු කණුව සිට බී. පී. මොහොමඩ් හන්දිය දක්වා පාර දෙපැත්තම.
5. ක්‍රොස් පාරේ මීමැඩුම ගොඩනැගිල්ල පටන් ගැනීමේ සිට ප්‍රනාන්දු පාර හා කෙළින් වීදියට වැටෙන හතරමංහන්දිය දක්වා පාර දෙපැත්තම.
6. තිල්ලන්දූව හන්දියේ සිට තලාදූව හන්දිය දක්වා වම් පැත්ත ජයන්ත ෆර්නිචර්ස් අසල බස් නැවතුම්පල ගොඩනැගිල්ල ඉදිරිපිට.
7. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ළඟ සිට උසාවිය දක්වා කෙලින් වීදිය පාර දෙපස හා කොටුව පිට්ටනිය වටරවුම් පාර දකුණු පැත්ත නව තානායම දක්වා වම් පැත්ත දිසා අධිකරණය දක්වා.
8. තලාදූව හන්දියේ සිට නික්ලස් මාර්කස් මාවතේ කොළඹ පාර දක්වා (දුම්රිය මාර්ගයට සමාන්තරව දිවෙන බිම් තීරුව).
9. කොප්පරා හන්දියේ සිට මහ වීදිය පල්ලිය දක්වා ප්‍රදේශය මාර්ගය දෙපස හා ජුවෙල් ලංකා ආයතනය ඉදිරිපිටින් ආරම්භ වන පරණ හලාවත පාරේ නේෂන් ට්‍රස්ට් බැංකුව දක්වා පාරේ වම් පැත්ත.
10. කොළඹ පුත්තලම් මාර්ගයේ අබේසේකර පාර ළඟ සිට දකුණු පැත්තේ මුදලිදු මෙන්ඩිස් මාවත දක්වා.
    මුදලිඳු මෙන්ඩිස් මාවතේ වම් පැත්ත හා විජේපාල මෙන්ඩිස් මාවතේ වම් පැත්ත.
11. කොළඹ පුත්තලම් මාර්ගයේ නවලෝක රෝහල අසල, ද සිල්වා මාවත දක්වා පාරේ වම් පැත්ත.
12. කොළඹ පුත්තලම් මාර්ගයේ බාල්දි හන්දියේ කොමර්ෂල් බැංකුව සිට ඉදිරියට සිංගර් මෙගා ආයතනය දක්වා පාරේ දකුණු පැත්ත

| | *විස්තරය* | *ගාස්තුව* |
|---|---|---|
| | | *රු. ශත* |
| (i) | යතුරු පැදියක් සඳහා | 20 0 |
| (ii) | ත්‍රීවීල් රථයක් සඳහා | 30 0 |
| (iii) | කාර්/වෑන් එකක් සඳහා | 50 0 |
| (iv) | ලොරියක් සඳහා | 60 0 |

### *II උපලේඛනය*

| | | *රු. ශත* |
|---|---|---|
| (i) | මීගමුව බස් නැවතුම් පලට ඇතුල් කරන සෑම බස් රථයක් සඳහා | 70 0 |
| (ii) | මීගමුව අමතර බස් රථ ගාලෙහි නවතා තබනු ලබන බස් රථයක් සඳහා | 30 0 |

04-277

---

### මීගමුව මහ නගර සභාව

#### ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තු අය කිරීම

මහ නගර සභා ආඥාපනතේ 267 වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 272(6) (ඇ) වගන්තිය ප්‍රකාරව මීගමුව මහ නගර සභාව වෙත පැවරී ඇති ව්‍යවස්ථා සෑදීමේ බලතල අනුව 2015.12.28 දිනැති අංක 1947/7 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කර වැළඳගත් සම්මත අතුරු ව්‍යවස්ථාවට අනුව ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ හා බලයලත් නිලධාරී, බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා වශයෙන් මහ නගර සභා ආඥාපනතේ 286(අ) වගන්තිය ප්‍රකාරව මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව පහත දැක්වෙන තීරණ ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එස්. සී. සුගත් කුමාර,
නාගරික කොමසාරිස්.
බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
මහ නගර සභාව,
මීගමුව.

මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා 2017 ජනවාරි මස 01 වැනි දින සිට මෙහි උපලේඛන I හා II හි සඳහන් ආකාරයට ගාස්තු අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. (රජයේ බදු ඇතුළුව)

**උපලේඛන I**

| අනු. අංකය | පුවරුවේ ස්වභාවය | වර්ග අඩි ප්‍රමාණය | වසරක් හෝ වසරකට අඩු කාලයක් සඳහා (රුපියල්) |
|---|---|---|---|
| 01 | එල්. ඊ. ඩී. තිර යොදාගෙන තමන්ගේ වෙළෙඳ ව්‍යාපාරය ප්‍රචාරය කිරීමේ පුවරුවක් සඳහා | 1ට | 500 |
| 02 | එල්. ඊ. ඩී. තිර යොදගෙන ව්‍යාපාරික වශයෙන් වෙනත් අයගේ ව්‍යාපාර ප්‍රචාරය කිරීමේ පුවරුවක් සඳහා | 1ට | 1,000 |
| 03 | ආලෝකමත් නොකළ ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා | 1ට | 50 |
| 04 | ආලෝකමත් කළ ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා | 1ට | 100 |
| 05 | පෞද්ගලික ඉඩම් මත හා ගොඩනැගිලි මත ප්‍රදර්ශනය කරන කටවුට් සඳහා | 1ට | 200 |

**උපලේඛන II**

| අනු. අංකය | ප්‍රචාරක දැන්වීමේ ස්වභාවය | වර්ග අඩි ප්‍රමාණය | දින සඳහා (රුපියල්) | සති සඳහා (රුපියල්) | මාස සඳහා (රුපියල්) |
|---|---|---|---|---|---|
| 01 | බැනර් සඳහා | 1ට | | සති 02 සඳහා රු. 30 | මාසයක් සඳහා රු. 40 මසකට වැඩි රු. 50 |
| 02 | කණුවල සවි කරන කොඩි සඳහා | 1ට | ප්‍රථම දින සිට දින 03 දක්වා රු. 15 | සති 01 සඳහා රු. 20<br>සති 02 සඳහා රු. 25 | |

04-276

---

## කන්තලේ ප්‍රාදේශීය සභාව

2017 වර්ෂයේ කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 150 වන වගන්තිය යටතේ කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016 වර්ෂයෙහි නොවැම්බර් මස 08 වැනි දින තීරණ අංක 860 පරිදි මා විසින් පහත තීරණය ගත් බව මෙයින් නිවේදනය කරමි.

බී. යූ. ඒ. එස්. උඩගෙදර,
ලේකම්,
කන්තලේ ප්‍රාදේශීය සභාව.

2016 දෙසැම්බර් මස 16 වැනි දින,
කන්තලේ,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

*(අ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වනු ලබන මෙහි පහත උපලේඛනයේ II වන තීරුවෙහි අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2017 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද,

*(ආ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන සෑම තැනැත්තකු විසින් යථෝක්ත බද්ද 2017.03.31 දිනට ප්‍රථම කන්තලේ ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ද තීරණය කරමි.

*උපලේඛනය*

| | *I වන තීරය*<br>*කර්මාන්තය* | *II වන තීරය*<br>*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාව* | *රු. 750 ඉක්මවන එහෙත් රු 1,500 නොඉක්මවන අවස්ථාව* | *රු. 1,500 ඉක්මවන අවස්ථාව* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | කබොක් ගල්, බොරළු ගල්, කළු ගල් කැනීම හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | වැලි ගොඩ දැමීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | බොරළු පස් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | යාන්ත්‍රික ලී ඉරීමේ හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | යාන්ත්‍රික නොවන ලී ඉරීමේ හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | මෝටර් සයිකල් අළුත් වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | වාහන විසිරු පින්තාරු කිරීම (ස්ප්‍රේ ප්‍රින්ටින්) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | ගඩොල් හෝ උළු නිපදවීම හා පිළිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ටයර් හෝ ටියුබ් වෝල්කනයිසින් කිරීම සඳහා ආයතනයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | බ්ලොක් ගල් හා සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | වැල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | වායු සමන යන්ත්‍ර ශීතකරණ හෝ අධිශීතකරණ නිපදවීම සර්විස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | විදුලි බලය පාවිච්චි කර වී කෙටීම හෝ සහල් පාහින මෝලක් පවත්වාගෙන යාම | | | |
| | i. අශ්වබල 01 සිට 10 දක්වා | 500 0 | 750 0 | 1,000 0 |
| | ii. අශ්වබල 01 සිට 10 දක්වා | 500 0 | 750 0 | 1,000 0 |
| | iii. අශ්වබල 01 සිට 10 දක්වා | 500 0 | 750 0 | 1,000 0 |

| | I වන තීරය<br>කර්මාන්තය | II වන තීරය<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම<br>රු. 750<br>නොඉක්මවන<br>අවස්ථාව | <br><br>රු. 750<br>ඉක්මවන<br>එහෙත් රු 1,500<br>නොඉක්මවන<br>අවස්ථාව | <br><br>රු. 1,500<br>ඉක්මවන<br>අවස්ථාව |
|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 19. | ඉන්ධන භාවිතා කර වී කෙටීම හෝ සහල් පාහින මෝලක් පවත්වාගෙන යාම | | | |
| | i. අශ්වබල 1 සිට 10 දක්වා | 500 0 | 750 0 | 1,000 0 |
| | ii. අශ්වබල 01 සිට 10 දක්වා | 500 0 | 750 0 | 1,000 0 |
| | iii. අශ්වබල 01 සිට 10 දක්වා | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | ද්‍රව නොවන ගෘහ භාණ්ඩ නිපදවීම හෝ අලෙවි හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | මත්ස්‍ය නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම, (ඉස්සන්, විසිතුරු මසුන්) | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ලී කැටයම් කරන ස්ථානයක් පවත්වාගෙන | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | කුෂන් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | බිම්මල් වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

04-436/1

---

## කන්තලේ ප්‍රාදේශීය සභාව

2017 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 149 වන වගන්තිය සහ 147 වන වගන්තිය යටතේ කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016 වර්ෂයෙහි නොවැම්බර් මස 08 වැනි දින තීරණ අංක 861 පරිදි මා විසින් පහත තීරණය ගත් බව මෙයින් නිවේදනය කරමි.

බී. යූ. ඒ. එස්. උඩගෙදර,
ලේකම්,
කන්තලේ ප්‍රාදේශීය සභාව.

2016 දෙසැම්බර් මස 16 වන දින,
කන්තලේ ප්‍රදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

### තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 149 වැනි වගන්තිය සහ 147 (1) (අ) ඡේදයෙන් කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවෙහි නිරූපිත යම් කාර්යයක් සඳහා කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2017 වර්ෂයේදී නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කල යුතු යැයි තීරණය කරමි.

උපලේඛනය

| I වැනි තීරය<br>බලය දෙනු ලබන කාර්යය | | II වැනි තීරය<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු. 750<br>නොඉක්මවන<br>අවස්ථාව | රු. 750<br>ඉක්මවන<br>එහෙත් රු 1,500<br>නොඉක්මවන<br>අවස්ථාව | රු. 1,500<br>ඉක්මවන<br>අවස්ථාව |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 01. | ධාන්‍ය හෝ මාංශ භෝග හොන්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | ගෑස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | කෝපි, ධාන්‍ය වර්ග, මාංශ භෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | විද්‍යුත් ලෝහ ආලේපන කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | කුකුල් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ඌරු මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ගවමස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | කුකුළන් 10 කට වැඩි ගණනක් සඳහා කුකුළන් කොටුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ශීත කළ මස්, මාළු ගබඩාකර තබාගැනීම හෝ ඒ භාණ්ඩ පමණක් විකිණීමට තබා ඇති ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | තේ, කෝපි, කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | භෝජනාගාරයක් (රෙස්ටුරන්ට්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | රසකැවිලි වර්ග නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | සිසිල් බීම නිෂ්පාදනය හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | කිරි එකතු කිරීමේ හෝ අලෙවි කිරීමේ හෝ විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | කුළු බඩු පැකට් කිරීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | කෑම වර්ග නිෂ්පාදනය කර පැකට් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

## කන්තලේ ප්‍රාදේශීය සභාව

2017 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 152 වැනි වගන්තිය යටතේ කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016 වර්ෂයෙහි නොවැම්බර් මස 08 වැනි දින තීරණ අංක 862 පරිදි මා විසින් පහත තීරණය ගත් බව මෙයින් නිවේදනය කරමි.

බී. යූ. ඒ. එස්. උඩගෙදර,
ලේකම්,
කන්තලේ ප්‍රාදේශීය සභාව.

2016 දෙසැම්බර් මස 16 වැනි දින,
කන්තලේ,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

*(අ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 152 වන උපවගන්තියේ (1) වන වගන්තියෙන් කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කන්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම 2016 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2017 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද,

*(ආ)* 1989 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (3) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2017.03.31 දිනට ප්‍රථම කන්තලේ ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ද තීරණය කරමි.

*උපලේඛනය*

| *I වැනි තීරය*<br>*2016 වර්ෂයේ ආදායම* | *II වැනි තීරය*<br>*රු. ශ.* |
|---|---|
| රු. 6,000 නොඉක්මවන අවස්ථාව | කිසිවක් නොමැත |
| රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | රු. 90 0 |
| රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | රු. 180 0 |
| රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | රු. 300 0 |
| රු. 75,000 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන අවස්ථාවක | රු. 1,200 0 |
| රු. 150,000 ඉක්මවන අවස්ථාවක | රු. 3,000 0 |

04-436/3

---

## කන්තලේ ප්‍රාදේශීය සභාව

2017 වර්ෂයේ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තිය සහ 148 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2016 වර්ෂයෙහි නොවැම්බර් මස 08 වැනි දින තීරණ අංක 863 පරිදි මා විසින් පහත තීරණය ගත් බව මෙයින් නිවේදනය කරමි.

බී. යූ. ඒ. එස්. උඩගෙදර,
ලේකම්,
කන්තලේ ප්‍රාදේශීය සභාව.

2016 දෙසැම්බර් මස 16 වැනි දින,
කන්තලේ,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

*(අ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය සහ 148 වන වගන්තිය යටතේ කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර කන්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2017 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන් එහි II තීරුවේ නිරූපිත බද්දක් පනවා 2017 වර්ෂය සඳහා අය කළ යුතු යැයි ද,

*(ආ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාරව බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2017.03.31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයිද තීරණය කරමි.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* *රු. ශත* |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 26 0 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා | |
| *(අ)* වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම් | 18 0 |
| *(ආ)* වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | 4 0 |
| සෑම කරත්තයක් සඳහා | 20 0 |
| සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| සෑම අශ්වයෙකු හෝ පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| සෑම ඇතෙකු සඳහා | 50 0 |

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ. මේ උපලේඛනයේ වෙළෙඳ කාර්යන්ට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

04-436/4

---

**කන්තලේ ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උප වගන්තියේ (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2016 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින තීරණ අංක 864 පරිදි මා විසින් පහත තීරණය ගත් බව මෙයින් නිවේදනය කරමි.

බී. යූ. ඒ. එස්. උඩගෙදර
ලේකම්,
කන්තලේ ප්‍රාදේශීය සභාව.

2016 දෙසැම්බර් මස 16 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි උපවගන්තියේ (3) වන උපවගන්තියෙන් කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා බලය දෙමින් එම උපලේඛනයෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ගාස්තුවක් 2017 වර්ෂය සඳහා අය කළ යුතු යැයි තීරණය කරමි.

*උපලේඛනය*

| *I වන තීරය*<br>*බලය දෙනු ලබන කාර්යය* | *II වන තීරය*<br>*ගාස්තුව රු.* |
|---|---|
| 01. පෝර්ම ගාස්තු හා පරිපාලන ගාස්තු : | |
| i. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු | 250 0 |
| ii. පාපැදි බලපත්‍ර පරිපාලන සේවා ගාස්තු | 46 0 |
| iii. දේපළ පවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු | 1,000 0 |
| iv. වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීම සඳහා සේවා ගාස්තු | 100 0 |
| v. නැවත නිකුත් කිරීමේ සේවා ගාස්තු | 100 0 |
| vi. ටෙන්ඩර් පෝරම ගාස්තු | 1,000 0 |
| vii. පුස්තකාල අයදුම්පත්‍ර ගාස්තු | 250 0 |

02. සභාව සතු වාහන කුලියට ලබා දීම

| *වාහනය* | *විස්තරය* | *ගාස්තුව (රු.) ශත* |
|---|---|---|
| i. ට්‍රැක්ටර් බවුසරය | දිනකට | 1,000 0 |
| ii. ට්‍රැක්ටර් සමග බවුසරය | දිනකට | 4,500 0 |
| iii. ලොකු ගල් රෝල | දිනකට | 10,000 0 |
| iv. මෝටර් ග්‍රේඩරය | පැය 01 | 4,500 0 |
| vi. ගලි බවුසරය | ලෝඩ් 1 (වැඩි වන කි.මී. 1 සඳහා) | 5000 0 |
| | | 200 0 |
| vii. ටිපර් රථය | දිනකට | 5,000 0 |
| viii. පස් තලන යන්ත්‍රය | දිනකට | 2,000 0 |
| iv. කුඩා ගල් රෝල | දිනකට | 3,750 0 |
| | (වැඩි වන 1 කි. මී. 1 සඳහා) | 50 0 |
| ix. ජේ. සී. බී යන්ත්‍රය | පැය 1 | 3,500 0 |

04. පොදු වෙළෙඳපල රථ ගාල් ගාස්තු

| | *රු.* |
|---|---|
| i. පාපැදි | 10 0 |
| ii. යතුරු පැදි | 20 0 |
| iii. ත්‍රී රෝද | 50 0 |
| iv. ලොරි රථ, බස් රථ, වෑන් රථ, වෙනත් බර වාහන | 100 0 |

| 05. ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු අය කිරීම | ස්වභාවය<br>ලී තහඩු ප්ලාස්ටික් ෆයිබර් | රෙදි, ඩිජිටල් ඉටිරෙදි බෝඩ් හෝ වෙනත් | තැන්පතු මුදල (එක් පුවරුවක් සඳහා) |
|---|---|---|---|
| *කාලය* | | | |
| සති 2 හෝ ඊට අඩු | 50 0 | 30 0 | 50 0 |
| මාස 1-6 | 75 0 | 50 0 | 100 0 |
| මාස 6 - අවුරුදු 1 | 100 0 | 75 0 | 150 0 |
| අවුරුදු 1 - අවුරුදු 2 | 150 0 | 100 0 | 250 0 |

04-436/5

**කන්තලේ ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂයට අදාළ වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 134 වන වගන්තියෙන් කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016 වර්ෂයෙහි නොවැම්බර් මස 08 වන දින තීරණ අංක 865 පරිදි මා විසින් පහත තීරණය ගත් බව මෙයින් නිවේදනය කරමි.

බී. යූ. ඒ. එස්. උඩගෙදර,
ලේකම්,
කන්තලේ ප්‍රාදේශීය සභාව.

2016 දෙසැම්බර් මස 16 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

**තීරණය**

*(අ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපළක 2016 වර්ෂය සඳහා පිළිගෙන ක්‍රියාත්මක කරනු ලැබූ 2008 වර්ෂයේ දී සිදු කරන ලද වාර්ෂික වටිනාකම 2017 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැන්වීමට

*(ආ)* 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ තුළ පිහිටි සෑම නිශ්චල දේපළක් සඳහාම උපලේඛනයේ දක්වා ඇති පරිදි වරිපනමක් පනවා අය කිරීමට; සහ

*(ඇ)* 134 (6) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යථෝක්ත වාර්ෂික වරිපනම් 2017 වර්ෂයේ මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්දට යටත් වන සෑම පුද්ගලයෙකුටම විධාන කිරීමට කන්තලේ ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

***උපලේඛනය***

*12% ක වාර්ෂික වරිපනම් බද්දක් අය කිරීමට ප්‍රකාශිත දේපළ විස්තර*

(1) කොට්ඨාස අංක 01 නුවර පාර වම, වරිපනම් අංක 33 සිට 97 දක්වා ද, නුවර පාර දකුණ, වරිපනම් අංක 04 සිට 82 දක්වා ද, වැව පාර වම, දකුණ සම්පූර්ණයෙන් ද කෝවිල් පාර සම්පූර්ණයෙන් ද,
(2) කොට්ඨාස අංක 02 සියලුම දේපළ ද,
(3) කොට්ඨාස අංක 03 සියලුම දේපළ ද,
(4) කොට්ඨාස අංක 04 සියලුම දේපළ ද,
(5) කොට්ඨාස අංක 05 අග්‍රබෝධි පාර, ගැමුණු මාවත, සිවන් කෝවිල් පාර, රජඇල පාර සහ ජනතා මාවත තුළ පිහිටි සියලුම දේපළ ද,
(6) කොට්ඨාස අංක 06 ත්‍රිකුණාමලය පාර, වරිපනම් අංක 03 සිට වරිපනම් අංක 197 දක්වා ද, ත්‍රිකුණාමලය පාර දකුණ සම්පූර්ණයෙන් ද, අග්‍රබෝධි පාර, සම්පූර්ණයෙන් ද,

*6% ක වාර්ෂික වරිපනම් බද්දක් අය කිරීමට ප්‍රකාශිත දේපළ විස්තරය*

(1) කොට්ඨාස අංක 06 ත්‍රිකුණාමලය පාර වරිපනම් අංක 07 සිට 198 දක්වා ද පරාක්‍රම මාවත දකුණ සම්පූර්ණයෙන් ද,
(2) ඉහත දේපළ සඳහා අයත් නොවන කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයට අයත් වන අනෙකුත් සියළුම දේපල.

04-436/6

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.